මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-
දිනය :- 2023.03.08
திகதி :-
Date :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව** - මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

---

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2023.03.08 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
- ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
- ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 මාර්තු මස මාසික සභා රැස්වීම 2023.03.08 දින ගරු සභාපති සෝමසිරි වීරමන් ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මන්ත්‍රීවරුනි,සමහර විට අද රැස්වීම අවසාන රැස්වීම වෙන්න පුළුවන්.පැමිණ සිටින උපසභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන් හා ලේකම්තුමිය ඇතුළු විෂයභාර නිලධාරීතුමියත් ඉතා ගෞරවයෙන් මං පිළිගනු ලබනවා.න්‍යායපත්‍රානුකූලව තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සම්මත කිරීමයි.අඩුපාඩුවක් හෝ සංශෝධනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා මං මේ අවස්ථාවේ ඉලලා සිටිනවා.

***පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2023.02.09 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

***01. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන - නැත***

***02. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- ඩබ්.කේ.ඩසිංක උදයංග මහතා විසින් ඉදිරිපත් කරන ලද"ගැඩවිල් දියර පොහොර හා ඝන පොහොර ව්‍යාපෘතිය පෙබරවාරි මස ආදායම්/වියදම් (පුනරාවර්ථන හා ප්‍රාග්ධන) වාර්තාව "යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- දික්ගහවත්ත,මාතර පාර,තෙලිජ්ජවිල,ඔකද රණවක මහතා විසින් ඉදිරිපත් කරන ලද"අත්පන්දු ක්‍රීඩාංගනය අලුත්වැඩියා කිරිම සඳහා"යන හිසින් යුත් සිංහ ක්‍රීඩා සමාජයේ ලිපිය සභා ගත කරන ලදී.
- උඩ පිට්ටනිය,කොටදූප,දම්පැල්ල,කේ.එච් චමින්ද කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද"ව්‍යාපාරික භූමියට ප්‍රවේශ වන එකම මාර්ගයට අලාභ හානි කිරීම සම්බන්ධව"යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.පී.උදය සාන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද"ප්‍රාදේශීය සභා මාර්ග වලට හානි වීම"යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- ජාතික විගණන කාර්යාලය විසින් එවන ලද"මූල්‍ය හා මෙහෙයුම් විගණනය -2022 මාලිම්බඩ ප්‍රාදේශීය සභාව "යන හිසින් යුත් විගණන විමසුම සභා ගත කරන ලදී.
- සංවර්ධන නිලධාරී එච්.බී.ගනේෂා ගීතානි මිය විසින් ඉදිරිපත් කරන ලද"කොම්පෝස්ට් ව්‍යාපෘතිය මාලිම්බඩ ප්‍රාදේශීය සභාව 2023 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**
2023.02.03 පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**
2023.02.03 පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:2</u>**
සෙන්ට්‍රල් පාර්ක් පොදු ඉඩමේ ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>තීරණ අංක 5:2</u>**
සෙන්ට්‍රල් පාර්ක් පොදු ඉඩමේ ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**
ගල්පමුණ එගොඩමුල්ල මාර්ගයේ මඩවගුරක්ව බවට පත්ව ඇති ස්ථානයට සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**
ගල්පමුණ එගොඩමුල්ල මාර්ගයේ මඩවගුරක්ව බවට පත්ව ඇති ස්ථානයට සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:4</u>**
අකුරුගොඩ දකුණ පරණවත්තහේන ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.(සුල්තානාගොඩ අකුරුගොඩ ප්‍රධාන මාර්ගයේ සිට ග්‍රාම නිලධාරි නලින් මහත්මාගේ නිවස දක්වා)

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා.

**<u>තීරණ අංක 5:4</u>**
අකුරුගොඩ දකුණ පරණවත්තහේන ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට තීරණය විය. .(සුල්තානාගොඩ අකුරුගොඩ ප්‍රධාන මාර්ගයේ සිට ග්‍රාම නිලධාරි නලින් මහත්මාගේ නිවස දක්වා)

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:5</u>**
අකුරුගොඩ දකුණ පරණවත්තහේන අසේල මහත්මයාගේ නිවස අසල සිට ඉන්දු මහත්මාගේ නිවස දක්වා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**<u>තීරණ අංක 5:5</u>**
අකුරුගොඩ දකුණ පරණවත්තහේන අසේල මහත්මයාගේ නිවස අසල සිට ඉන්දු මහත්මාගේ නිවස දක්වා සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:6</u>**
ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ බිම් මහලේ දොර ජනෙල් සවිකල යුතු යැයි ගරු සභාවට යෝජනා කරමි

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**තීරණ අංක 5:6**
ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ බිම් මහලේ දොර ජනෙල් සවි කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 5:7**
හොරගොඩ ප්‍රජා ශාලාව සඳහා විදුලිය ලබා ගැනීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් විදුලිය ලබා ගැනීමට අවශ්‍ය උපකරණ සහ බට එලීම් සිදු කර ඇතත් එල් වයරින් සවි කිරීමට නොහැකි වූ නිසා විදුලි සැපයුම ලබා ගැනීමට අපහසු වුණි.දැනට එල් වයරින් සවිකර ඇති බැවින් වෙන්ව ඇති ප්‍රතිපාදන මුදලින් විදුලි සැපයුම ලබා ගැනීමටත් ඒ වෙනුවෙන් මුදල් අඩුපාඩුවක් පවතින්නේ නම් එම මුදල සහා අරමුදලින් ලබා දීමත් සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

**තීරණ අංක 5:7**
හොරගොඩ ප්‍රජා ශාලාව සඳහා විදුලිය ලබා ගැනීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් විදුලිය ලබා ගැනීමට අවශ්‍ය උපකරණ සහ බට එලීම් සිදු කර ඇතත් එල් වයරින් සවි කිරීමට නොහැකි වූ නිසා විදුලි සැපයුම ලබා ගැනීමට අපහසු වුණි.දැනට එල් වයරින් සවිකර ඇති බැවින් වෙන්ව ඇති ප්‍රතිපාදන මුදලින් විදුලි සැපයුම ලබා ගැනීමටත් ඒ වෙනුවෙන් මුදල් අඩුපාඩුවක් පවතින්නේ නම් එම මුදල සහා අරමුදලින් ලබා දීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**යෝජනා අංක 6:1**
ජේ.ජේ.එස් පිනිදිය මහතා විසින් ඉදිරිපත් කරන ලද BA/2016/25 දරණ අයදුම්පතට අයත් ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් බවද අදාළ ගොඩනැගිලි අයදුම්පත මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගෙන සභාවට ඉදිරිපත් කරන ලෙසද දීර්ඝ කාලයක් තිස්සේ දැනුවත් කරත් මේ දක්වා ඊට යහපත් ප්‍රතිචාරයක් නොමැති බැවින් මෙම ගොඩනැගිලි අයදුම්පත සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**තීරණ අංක 6:1**
ජේ.ජේ.එස් පිනිදිය මහතා විසින් ඉදිරිපත් කරන ලද BA/2016/25 දරණ අයදුම්පතට අයත් ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් බවද අදාළ ගොඩනැගිලි අයදුම්පත මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගෙන සභාවට ඉදිරිපත් කරන ලෙසද දීර්ඝ කාලයක් තිස්සේ දැනුවත් කරත් මේ දක්වා ඊට යහපත් ප්‍රතිචාරයක් නොමැති බැවින් ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 6:2**
තෙලිජ්ජවිල හා මාලිම්බඩ පිහිටි පොදු වැසිකිලි පද්ධතිය ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි වැසිකිලි පද්ධතියක් නොවන නිසා ඉන් ආදායමක් ඉපයීමට නොහැකි වීම හේතුවෙන් වසර කීපයක සිටම ටෙන්ඩර් කරද එය ලබා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවන බැවින් 2023

වර්ෂයේ තෙවනවර ටෙන්ඩර් කිරීමේදී එම දේපළ ටෙන්ඩර් නොකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>තීරණ අංක 6:2</u>**

තෙලිජ්ජවිල හා මාලිම්බඩ පිහිටි පොදු වැසිකිලි පද්ධතිය ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි වැසිකිලි පද්ධතියක් නොවන නිසා ඉන් ආදායමක් ඉපයීමට නොහැකි වීම හේතුවෙන් වසර කීපයක සිටම ටෙන්ඩර් කරද එය ලබා ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවන බැවින් 2023 වර්ෂයේ තෙවනවර ටෙන්ඩර් කිරීමේදී එම දේපළ ටෙන්ඩර් නොකිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:3</u>**

ඇල්ගිරිය කොට්ඨාශයේ ඇල්ගිරිය වසමේ පිටිවිලහේන පාර වලවල් සෑදී ඉතා අබලන් තත්ත්වයට පත්වී ගමනාගමනයට ඉතා අපහසු බැවින් කානු කපා පස් දමා සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

ඇල්ගිරිය කොට්ඨාශයේ ඇල්ගිරිය වසමේ පිටිවිලහේන පාර වලවල් සෑදී ඉතා අබලන් තත්ත්වයට පත්වී ගමනාගමනයට ඉතා අපහසු බැවින් කානු කපා පස් දමා සකස් කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:4</u>**

හොරගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් එකමුතු මාවතේ මාරගහකනත්ත නිවස අසල ඇති පොදු ළිඳ භාවිතා කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බැවින් කොන්ක්‍රීට් අතුරා භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:4</u>**

හොරගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් එකමුතු මාවතේ මාරගහකනත්ත නිවස අසල ඇති පොදු ළිඳ භාවිතා කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බැවින් කොන්ක්‍රීට් අතුරා භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට සකස් කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:5</u>**

තෙලිජ්ජවිල වල්පිට කැරන්තොල්ල මාර්ගය මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙසට ගැසට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**<u>තීරණ අංක 6:5</u>**
තෙලිජ්ජවිල වල්පිට කැරන්තොල්ල මාර්ගය මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙසට ගැසට් කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**
මාලිම්බඩ උතුර ලෙනාඩ් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ සෑදී ඇති වල නිසා ගමනාගමනයේදී ජනතාව අනතුරුදායක තත්ත්වයට පත්ව ඇති බැවින් එය සකස් කිරීමට යෝජනා කරන අතර ඒ සඳහා අදාල ඇස්තමේන්තුව අනුමත කිරිමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:6</u>**
මාලිම්බඩ උතුර ලෙනාඩ් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ සෑදී ඇති වල නිසා ගමනාගමනයේදී ජනතාව අනතුරුදායක තත්ත්වයට පත්ව ඇති බැවින් එය සකස් කිරීමට යෝජනා කරන අතර ඒ සඳහා අදාල ඇස්තමේන්තුව අනුමත කිරිමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**
විදි පහන් නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරන ගෙවීම් සිදු කිරීමට ප්‍රතිපාදන නොමැති බව දන්වා ඇති නිසාත් ඒ සම්බන්ධ ගිවිසුම් අත්සන් කිරීම ද අත්හිටුවා ඇති බැවින් ගිණුම් ලේඛණ වල 2021වර්ෂයේ ණය ගැති ලෙස සටහන්ව ඇති රු.39312.00ක ශේෂය කපා හැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**
විදි පහන් නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරන ගෙවීම් සිදු කිරීමට ප්‍රතිපාදන නොමැති බව දන්වා ඇති නිසාත් ඒ සම්බන්ධ ගිවිසුම් අත්සන් කිරීම ද අත්හිටුවා ඇති බැවින් ගිණුම් ලේඛණ වල 2021වර්ෂයේ ණය ගැති ලෙස සටහන්ව ඇති රු.39312.00ක ශේෂය කපා හැරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:8</u>**
හොරගොඩ පොදු සුසාන භූමිය ස්ථානීය පරීක්ෂණය 2023.03.07 දින සිදු කළ අතර එහිදී විමර්ශන නිලධාරී ලබා දුන් උපදෙස් මත නැවත මෙම ස්ථානය පරික්ෂා කිරීම සිදු කළ යුතු බවත් මිනින්දෝරු මහතෙකු ලවා මායිම් ලකුණු කර අනවසරකරු ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**<u>තීරණ අංක 6:8</u>**
හොරගොඩ පොදු සුසාන භූමිය ස්ථානීය පරීක්ෂණය 2023.03.07 දින සිදු කළ අතර එහිදී විමර්ශන නිලධාරී ලබා දුන් උපදෙස් මත නැවත මෙම ස්ථානය පරික්ෂා කිරීම සිදු කළ යුතු

බවත් මිනින්දෝරු මහතෙකු ලවා මායිම් ලකුණු කර අනවසරකරු ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:9</u>**
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද තක්සේරුවට අනුව මාලිම්බඩ පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලයේ පහළ මහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත රු.50,000.00ක මාසික කුලී පදනම මත ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

**<u>තීරණ අංක 6:9</u>**
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද තක්සේරුවට අනුව මාලිම්බඩ පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලයේ පහළ මහල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත රු.50,000.00ක මාසික කුලී පදනම මත ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:10</u>**
මාලිම්බඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ සියඹලාගහවත්ත මාලගේවත්ත හරහා කැටගල් අල්ලා සංවර්ධනය කරන ලද ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයෙහි නියමිත අඩි ප්‍රමාණය නොමැති බැවින් නීත්‍යානුකූල ප්‍රමාණය තහවුරු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:10</u>**
මාලිම්බඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ සියඹලාගහවත්ත මාලගේවත්ත හරහා කැටගල් අල්ලා සංවර්ධනය කරන ලද ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයෙහි නියමිත අඩි ප්‍රමාණය නොමැති බැවින් නීත්‍යානුකූල ප්‍රමාණය තහවුරු කිරීම සඳහා තාක්ෂණ නිලධාරී නිර්දේශය අනුව කටයුතු කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:11</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පරණවත්තහේන ඉඩම බදු පදනම මත ලබාගත් ජේ.ඩබ්.පී.පත්මලතා මියගේ ඉල්ලීම මත ඉඩමේ බිම් ප්‍රමාණය නිරවුල් කර දීම සඳහා මිනින්දෝරුවරයෙකු ලවා ඔප්පුවට අනුව පිඹුරුපත් සකස් කර මායිම් ලකුණු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පරණවත්තහේන ඉඩම බදු පදනම මත ලබාගත් ජේ.ඩබ්.පී.පත්මලතා මියගේ ඉල්ලීම මත ඉඩමේ බිම් ප්‍රමාණය නිරවුල් කර දීම සඳහා මිනින්දෝරුවරයෙකු ලවා ඉඩම් කැබිලි දෙකම මැනීමටත් ඔප්පුවට අනුව පිඹුරුපත් සකස් කර මායිම් ලකුණු කිරීමටත් සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:12</u>**

2023 – 2027 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සහා අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:12</u>**

2023 – 2027 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සඳහා සහා අනුමැතිය ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:13</u>**

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල මගින් එවා ඇති අංක ENMT/01/IN/202258169 හා 2023.01.04 දිනැති ලිපිය අනුව අධිභාර මුදල වන රු.685,052.53 ක මුදල ගෙවීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මඟින් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:13</u>**

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල මගින් එවා ඇති අංක ENMT/01/IN/202258169 හා 2023.01.04 දිනැති ලිපිය අනුව අධිභාර මුදල වන රු.685,052.53 ක මුදල ගෙවීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මඟින් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීමට සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:14</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරන ගැඩවිලි සන පොහොර මූලද්‍රව්‍ය පරීක්ෂාවක් සඳහා කුරුණෑගල sustainable agriculture research and development center වෙත යැවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:14</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරන ගැඩවිලි සන පොහොර මූලද්‍රව්‍ය පරීක්ෂාවක් සඳහා කුරුණෑගල sustainable agriculture research and development center වෙත යැවීමට තිරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා</u>

සභාපතිතුමා මේ යෝජනා හොඳයි අපි එකඟයි.හැබැයි යෝජනා දැම්මට ක්‍රියාත්මක වන තත්ත්වයක් පේන්න නෑ.මේ අවසාන මොහොතේ තව තවත් යෝජනා දාලා හිර කරනවද නැත්තම් දාපු යෝජනා ක්‍රියාත්මක කරනවාද කියන ප්‍රශ්නය තියනවා.සභාපතිතුමනි මං මේකට විස්තරයක් බලාපොරොත්තු වෙනවා.අපිටත් යෝජනා තියනවා අපි යෝජනා නොදාන්න හේතුව තමයි දාපු යෝජනා ක්‍රියාත්මක නොවීම.ඒ නිසා සභාපතිතුමා විශේෂයෙන් මගේ පාරවල් තියනවා මැදගොඩ ප්‍රධාන පාර,ගුණසේකර මාවත වාගේ පාරවල් අඩුම ගානේ මුකුත් නැත්තම් යන්න එන්න පුළුවන් විදියට හදලා දෙන්න කියලා ඉල්ලනවා.ඒ වගේම මැදගොඩ ප්‍රජා ශාලාවේ විදුලිය ලබා දීම.මේ යෝජනා දෙක තුන ක්‍රියාත්මක කරනවා නම් මගේ උපරිම සහයෝගය ඔබතුමාට ලබා දෙනවා මේ යෝජනා නැවත ඉදිරිපත් කරනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මයා</u>

මන්ත්‍රීතුමනී,තමුන්නාන්සේලා කවුරුත් දන්නවා අපිට පසුගිය කාලේ පුරාවට වැඩක් කරන්න වුනේ නෑ.පළාත් පාලන කොමසාරිස්තුමා අපිට ලිඛිතව කියලා එවලා තියනවා සංවර්ධන කටයුතු කරන්න එපා කියලා.ඊටපස්සෙ මාස දෙකකට කලින් 60%ක් දක්වා වියදම් කරන්න කියලා අනුමැතිය ආවා.ඊටපස්සෙ අපි කාගෙත් අරමුණ තිබුණා ආදාහනාගාරය ඉදි කරන්න.මේ ආදාහනාගාරය යෝජනාව කවුරුත් සභාවේ සම්මත කරපු නිසා එය ඉදිකිරීමේ මූලික කටයුතු අවසන් කලා.කවුරුත් අනුමත කලා ආදාහනාගාරය සඳහා ණය මුදලක් ගන්න.ලක්ෂ 500ක් -600ක් අතර ණය මුදලක් අනුමත වෙලා තියනවා.අපි දෙසැම්බර් මාසේ බලාපොරොත්තු වුණා ඒ ආදාහනාගාරෙ වැඩ කටයුතු ආරම්භ කරන්න.ඒ සඳහා කෝටි 3ක පමණ මුදලක් වැයවනවා.දෙසැම්බර් මාසේ විශේෂ සභා රැස්වීමකදි ඒක ක්‍රියාත්මක කරන්න එපා කියලා ඒක පරාද වුණා.අපිට මුදල් ඉතිරි වුණා ඒ නිසා දෙසැම්බර් මාසේ ඉඳලා තමයි වැඩ ආරම්භ කරන්න ක්‍රියාත්මක වුණේ.ඔබතුමා කියපු පාරවල් 3ක් RDA එකට දැම්මා මැදගොඩ පාර,ගල්ඇන්දකුට්ටිය පාර සහ ඒක ඇස්තමේන්තුව තියනවා ලක්ෂ 27ක්.අපේ සභාවේ අනුමත කරන්න බෑ TO මිස්ලට තාර දාන්න ඇස්තමේන්තු හදන්න.අපි RDA එකට ලියුමක් යැව්වා මේක හදලා දෙන්න කියලා.එතනදි ඇස්තමේන්තුව හැදුන්නෑ.පළමු ලියුම යැව්වේ උපසභාපතිතුමා.නමුත් එතනදිත් ඇස්තමේන්තුව හැදුනෙ නෑ.ඊට පස්සෙ මාර්ග සංවර්ධනේ සභාපතිතුමා සමඟ සාකච්ඡාවක් තිබුනා වැලිගම ප්‍රාදේශීය සභාවේ පාරවල් සම්බන්ධව.ඒ වෙලාවෙදි මං මේ කාරණා ඉදිරිපත් කරා.අපිට තාර දාන පාරවල් තියනවා ඇස්තමේන්තු කරගන්න විදියක් නෑ ඇස්තමේන්තු කරලා දෙන්න කියලා.ඒ අනුව සභාපතිතුමා නියෝගයක් දුන්නා මේ පාරවල් ටික ඇස්තමේන්තු

**7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

**8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9) වෙනත් කරුණු**

.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>
<u>ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා</u>

ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා

ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
.

ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව